www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# උස්බෙකිස්තානය: එක්සත් ජනපද පිටුබලය ලබන ආඥාදායකයා කැරැල්ල ලේ විලක ගිල්වයි

## Uzbekistan: US – backed dictator drowns uprising in blood

බිල් වෑන් ඕකන් විසිනි

2005 මැයි 14

විරෝධතාකරුවන් ආන්ඩුවේ කාර්යාලවලට කඩාවැදීම සහ බන්ධනාගාරයකට කඩාවැදී සිරකරුවන් දහස් ගනනක් නිදහස් කිරීමෙන් පසුව, උස්බෙකිස්තාන ආන්ඩුවේ හමුදාවන් සිකුරාදා ඇන්ඩිජාන්හි නැගෙනහිර නගරයේ කල වෙඩි තැබීම්වලින් දුසිම් ගනනක් මරනයට පත්වී තවත් බොහෝ ගනනක් තුවාල ලැබූ බව ප්‍රදේශයේ රෝහල් වාර්තා කලේ ය.

නගරයෙන් ලැබෙන වාර්තාවලට අනුව නගරයේ මධ්‍යම චතුරස්‍රයේ දී, පිරිමින්, ගැහැනුන් හා ළමුන් දහස් ගනනකගේ සහභාගිත්වයෙන් පැවති විරෝධතා පෙලපාලියකට මිලිටරි ඒකක වෙඩි තැබූහ. ''සාධාරනත්වය'' හඬ නැගීම සඳහා විරෝධතාකරුවන් රැස් වී තිබුනේ ''සාමය'' ''නිදහස'' සහ ''රැකියා'' සඳහා හඬ නැගීමට ය.

ප්‍රදේශයේ මිනිසුන් 23 දෙනෙක් සිරගත කිරීම නිසා කැරැල්ල පැන නැගුනි. ඔවුන්ගෙන් බොහෝදෙනා ඉස්ලාමීය අන්තවාදී ආන්ඩුව විසින් චෝදනා කරන ලද ප්‍රමුඛ පෙලේ ව්‍යාපාරිකයෝ ය. කෙසේ වුවද, මුනගැටුමට යටින් පවතින්නේ බුෂ් පරිපාලනයේ ඊනියා ත්‍රස්තවාදයට එරෙහි ලෝක යුද්ධයේ ප්‍රමුඛ සහකරුවකු වන ජනාධිපති ඉස්ලාම් කරිමොව්ගේ ආඥාදායක තන්ත්‍රයේ සාහසික ක්‍රම, මහජන විරැකියාවට හා දුප්පත්කමට එරෙහිව කාලයක් පුරා පවතින මහජන විරෝධය යි. විරෝධතාකරුවන් ආන්ඩුවේ කාර්යාලවලට කඩාවැදීම සහ බන්ධනාගාරයකට කඩාවැදී සිරකරුවන් දහස් ගනනක් නිදහස් කිරීමෙන් පසුව, උස්බෙකිස්තාන ආන්ඩුවේ හමුදාවක් සිකුරාදා ඇන්ඩිජාත්හි නැගෙනහිර නගරය තුල වෙඩි තැබීම්වලින් දුසිම් ගනනක් මරනයට පත් වී තවත් බොහෝ ගනනක් තුවාල ලැබූ බව ප්‍රදේශයේ රෝහල් වාර්තා කලේ ය.

මිලියන 26ක ජනගහනයකින් සමන්විත උස්බෙකිස්තානය මධ්‍යම ආසියාව තුල පවතින පැරනි සෝවියට් සමූහාන්ඩුවලින් විශාලතම එකයි.

විරෝධතාකරුවන් ''අපරාධකාරයන්'' , ''මංකොල්ලකරුවන්'' හා ''අන්තවාදීන්'' ලෙස හංවඩු ගැසූ කරිමොව් තන්ත්‍රය කිසිදු සාකච්ඡාවක් ප්‍රතික්ෂේප කලා ය. උස්බෙක් සොල්දාදුවන් වීදීවල ගැහැනුන් හා ළමුන් වෙඩි තබා මරා දමමින් සිටියදී පවා රජයට අයත් මාධ්‍ය ''කැරලි කරුවෝ'' ''මිනිස් පලිහ'' ලෙස ගැහැනුන් හා ළමුන් යොදාගනිමින් සිටින බව ව්‍යාජ වාර්තා ප්‍රකාශ කරනු ලැබූහ.

මර්දනය පිලිබඳ කිසිදු ස්වාධීන වාර්තාවක් ඉදිරිපත් කිරීම වලකමින් උස්බෙක් ආන්ඩුව, සීඑන්එන්, බීබීසි හා රුසියානු ජාලවලින් පැමිනි ජාත්‍යන්තර රූපවාහිනී සංඥා වැලක්වී ය.

මිනිසුන් 23 දෙනා නඩුවට ඉදිරිපත් කර තිබුනු අධිකරන කාමරයෙන් පිටත පැවති සාමකාමී විරෝධතාවන් සමග කැලඹීම ආරම්භ විය. නමුත් අනතුරුව සිකුරාදා උදෑසන ප්‍රාදේශීය මිලිටරි කඳවුරක් අල්ලාගත් ජනයා ආයුධ දුසිම් ගනනක් පැහැර ගනිමින් චූදිතයන් රඳවනු ලැබ සිටි බන්ධනාගාරය වෙත පෙලපාලියකින් ගමන් කලහ.

මෙම ක්‍රියාවට සහභාගිවූ බොහෝ දෙනා තරුන විරෝධතාකරුවන් තමන්ට රටෙහි ඉස්ලාමීය මූලධර්මවාදී ව්‍යාපාරය සමග කිසිදු සම්බන්ධතාවක් නැති බව ප්‍රකාශ කලහ.

''තමන් ඉස්ලාමීය අන්තවාදීන් නොවන බව ඔවුහු ප්‍රකාශ කරති. ඔවුහු විරැකියාවෙන් හා අසාධාරනයෙන් හෙම්බත් වී සිටින සාමාන්‍ය ජනයා ය. ඔවුන්ට හුදෙක්ම අවශ්‍යතාව වන්නේ යහපත් ජීවන කොන්දේසි ය. යුද්ධය හා සාමය පිලිබඳව වාර්තා කරන ආයතනයේ උස්බෙකිස්තාන අධ්‍යක්ෂකවරයා වන ගැලීමා බුතර්බීවා සීඑන්එන් වෙත පැවසීය.

සංහාරයට ගොදුරු වූ විරෝධතාකරුවන් හා ඔවුන්ව මරා දැමූ ආන්ඩුවේ මිනීමරුවන් යන දෙගොල්ලන්ගෙන් ම ''සංසුන් ''වන ලෙස ඉල්ලා සිටිමින් බුෂ්ගේ ධවල මන්දිරය වංචනික ප්‍රකාශයක් නිකුත් කලහ.

''උස්බෙකිස්තාන ජනයාට තමන්ට වඩා හොඳින් නියෝජනය වන හා ප්‍රජාතන්ත්‍රවාදී ආන්ඩුවක් අවශ්‍ය ය. නමුත් එය ඉටුකරගත යුත්තේ ප්‍රචන්ඩත්වයෙන් නොව සාමකාමී මාධ්‍යයන් මගිනි. අපගේ පනිවුඩය

එය යි.'' ''උස්බෙකිස්තානයේ, මානව අයිතිවාසිකම් පිලිබඳව අපි සැලකිලිමත් වීමු. නමුත් දැන් අපි විශේෂයෙන් ම බන්ධනාගාරවලින් නිදහස් වී පැමිනි ත්‍රස්තවාදී සංවිධානයක සමහර සාමාජිකයින් සිදු කරන ප්‍රචන්ඩ ක්‍රියා දිග හැරීම පිලිබඳව සංවේදීව සිටිමු.'' ධවල මන්දිර ප්‍රකාශක ස්කොට් මැක්ලෙලන් පැවසී ය.

කොමියුනිස්ට් පක්ෂයේ හිටපු ලේකම්වරයෙකු වන කරිමොව්ට වොෂින්ටනය සමග සමීප සබඳතා ඇත. දශකයකට වැඩි කාලයක් පුරා විරුද්ධ පක්ෂ තහනම් කර ඇති ඔහු, දෑඩි පුවත් තහනමක් පවත්වා ගෙන යන අතර තක්සේරුගත දේශපාලන සිරකරුවන් 6,000ක් රඳවා සිටිති. හිංසා පැමිනවීමේ අතිශය සාහසික විධික්‍රම පිලිබඳව ඔහුගේ තන්ත්‍රය කුප්‍රකට ය.

ජලයේ ගිල්වීම, හුස්ම හිර කිරීම, දූෂනය හා චූදිතයන් මරනයට පත් වන තුරු තැම්බීම පවා ප්‍රශ්නකිරීම්වලට ඇතුලත් වූ බවට ඡායාරූප සාක්ෂ්‍ය තමන් දැක තිබුනු බවට උස්බෙකිස්තානයේ හිටපු බ්‍රිතාන්‍ය තානාපති ක්‍රෙග් මරේ සාක්ෂි දැරීය.

පසුගිය වසරේදී *ෆයිනෑන්ෂල් ටයිම්ස්* පුවත් පතට හෙලිදරව් වුනු බ්‍රිතාන්‍ය විදේශ කාර්යාලයට යැවුනු රහසිගත ලියවිල්ලක මරේ මෙසේ ලිවී ය. ''තොරතුරු ලබා ගැනීම සඳහා (වාර්තා වන ත්‍රස්තවාදි ක්‍රියාකාරකම් පිලිබඳව) සිරකරුවන්ට හිංසා පැමිනවීම උස්බෙක් නිලධාරීහු කරමින් සිටිති. එක්සත් ජනපදය (එජ) වෙත සපයනු ලබන එම තොරතුරු එහි මධ්‍යම රහස්තොරතුරු ඒජන්සිය හරහා එක්සත් රාජධානියට යවනු ලබයි.''

මානව හිමිකම් උල්ලංඝනය කිරීම් පිලිබඳව උස්බෙක් තන්ත්‍රය විවේචනය කරමින් එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව නිල වාර්තා නිකුත් කර ඇති නමුදු නිශ්චිතවම, එම තන්ත්‍රය හිංසා කිරීම් සිදු කරන නිසා ''ත්‍රස්තයට එරෙහි යුද්ධයේදී'' රඳවා ගැනුනු අය උස්බෙකිස්තානයට ''බාරදීමට'' සීඅයිඒයට හා මිලිටරියට බුෂ් පරිපාලනය අවසර දී ඇත.

ආසන්න වශයෙන් එක්සත් ජනපද සොල්දාදුවන් 1,500ක් රඳවනු ලැබ සිටින කාර්ෂි හනබාද් හි වැදගත් මිලිටරි කඳවුරක් පෙන්ටගනයට සම්පාදන කිරීමට හිලවු ලෙස වාර්ෂිකව එක්සත් ජනපද ඩොලර් මිලියන සිය ගනනක ආධාර කරිමොව් තන්ත්‍රයට ලැබෙයි. අසල්වාසී ඇෆ්ගනිස්තානයේ යුද්ධය දිගට ම කර ගෙන යාම සඳහා ප්‍රධාන සම්පාදකයක් ලෙස ක්‍රියා කරන මෙම කඳවුර මධ්‍යම ආසියාවේ අනෙකුත් ප්‍රදේශවල එක්සත් ජනපද මිලිටරි බලය සැලසුම් කිරීමේ වේදිකාවක් ලෙස ද ක්‍රියා කරයි.

තමන්ගේ ම ජනයාට එරෙහිව ක්‍රියාවට දැමෙමින් තිබෙන සාහසික ක්‍රම ත්‍රස්තවාදයට එරෙහි ලෝක පරිමාන අරගලයේ කොටසක් ලෙස හුවා දක්වමින් වොෂින්ටනයේ සහාය තමන් වෙත ඇද ගැනීමට උස්බෙක් ආඥාදායකයා සමත්ව ඇත.

තමන් පුද්ගලිකවම මර්දනය මෙහෙයවීම සඳහා ටැෂ්කන්ට් අගනුවර සිට ඇන්ඩිජාන් බලා කරිමොව් පියාසර කල බවට වාර්තා ඇත.

© www.wsws.org